ස.සේ.කො.චක්‍රලේඛ අංක : 02/2020

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමූපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල, දෙවන මහල,
කුරුණෑගල.
2020.01. 07

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමූපකාර සමිති,
පළාත් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය හා,
වයඹ සමූපකාර මහා සංගමය, ස.ණ.ස. සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමිති හා සංගම් වල ගරු සභාපති හා
සාමාන්‍යාධිකාරීවරුන් වෙත,

**1/2015 චක්‍රලේඛයේ සඳහන් අලෙවි කළමණාකරු හා වෙළඳ සහකාර යන තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීම.**

වයඹ පළාත් සමූපකාර සේවකයින් සඳහා අනුමත තනතුරු , වැටුප් සහ බඳවා ගැනීමේ සුදුසුකම් දක්වා ඇති 1/2015 චක්‍රලේඛයේ, 36 (අලෙවි කළමණාකරු) හා 58 (වෙළඳ සහකාර) යන තනතුරු කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එහි සඳහන් අලෙවි කළමණාකරු හා වෙළඳ සහකාර යන තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීම හා රඳවා ගැනීම සම්බන්ධයෙන් වන ගැටලු හා සමිති වල සේවා අවශ්‍යතාවය සලකා බලා එහි 36 'ආ' උප වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමටත්, අංක 58 (වෙළඳ සහකාර) තනතුර සඳහා නව උප වගන්තියක් ඇතුළත් කිරීමටත්, ඒ අනුව විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කරමින් මෙම තනතුරු සඳහා සේවකයින් බඳවාගෙන එදින සිට සති හයක් (06) ඇතුලත තනතුරු අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසට, 2020.01.02 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී තීරණය කරන ලදි.

03. ඒ අනුව ඉහත පරිදි සේවකයෙකු බඳවාගත් දින සිට සති හයක (06) කාලය ඉකුත් වීමෙන් පසුව තනතුරු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩි දුරටත් දන්වමි.

| මට්ටම | තනතුරු නාමය | වැටුප් සංකේත අංකය | ශ්‍රේණිය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| මෙහෙයුම් | අලෙවි කළමණාකරු | OL | iii | ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල ඇතුළුව විෂයයන් 03කට සම්මාන සහිතව ගණිතය විෂය ද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත් වීම. |
| කළමනාකරණ සහය සේවා | වෙළඳ සහකාර | MSSL | iii | අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වීම. |

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී.විජේරූප,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

පිටපත්- :
1. ප්‍රධාන ලේකම් - වයඹ පළාත. - කා. දැ.පි.
2. ලේකම්, සමූපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි . - අ.ක.ස.
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි. - අ.ක.ස.